# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1806 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/12/2024<br>පැය 0600 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - සිරිපාගම පොලිස් වසම.

2024.12.04 වන දින උදෑසන කාලයේදී සිරිපාගම පොලිස් වසමේ කැටවල ප්‍රදේශයේදී පුද්ගලයෙකු විසින් කාන්තාවකට පොල්ලකින් පහරදීම හේතුවෙන් තුවාල ලබා ගිලීමලේ රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා රත්නපුරය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට සිරිපාගම පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 23 ක් වූ රත්නපුරය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය පහරදීම සිදුකල පුද්ගලයා සමග ප්‍රේම සම්බන්ධතාවයක් පවත්වා ඇති අතර දෙදෙනා අතර ඇතිවූ බහින්බස් වීමක් දුරදිග යාමෙන් පොල්ලකින් පහරදී මෙම ඝාතනය කර ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය රත්නපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධියෙන් පසු සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා සිරිපාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දේපල සොරකම් රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය .

2024.12.04 වන දින උදෑසන කාලයේදී දෙහිවල පොලිස් වසමේ දෙහිවල දුම්රිය පල අසලදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්

කණ්ඩායමක් විසින් දේපල සොරකම් රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන බෝතලේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී ගල්කිස්ස, දෙහිවල, වැල්ලවත්ත, බම්බලපිටිය, කොල්ලුපිටිය යන පොලිස් වසම් වල සිදු කරන ලද දේපල සොරකම් **රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.**

සැකකරු විසින් සොරකම් කරන ලද ලැප්ටොප් යන්ත්‍ර 01ක්, පාපැදි 04ක් හා ජංගම දුරකතන 01ක් පොලිස් භාරයට ගෙන ඇති අතර බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.12.04 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඕඩියන් හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2024.12.04 වන දින සවස් කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල කුලියාපිටිය මාර්ගයේ බොරළුවල දේවාල හන්දිය අසලදී කුලියාපිටිය දෙස සිට නාරම්මල දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව හා යතුරුපැදිකරු නාරම්මල රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වූ කඩහපොල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාරම්මල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වාලච්චේන පොලිස් වසම.

2024.12.04 වන දින රාත්‍රී කාලයේ වාලච්චේන පොලිස් වසමේ පොළොන්නරුව නාවල්අඩි මාර්ගයේ මියන්කුලම ප්‍රදේශයේදී නාවල්අඩි දෙස සිට පොළොන්නරුව දෙසට ධාවනය වූ ටිපර් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු, පිටුපස ගමන් කල කාන්තාවක්, පිරිමි පුද්ගලයෙකු හා වයස අවුරුදු 13ක පිරිමි දරුවෙකු තුවාල ලබා වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමේදී පිටුපස ගමන් කල පිරිමි පුද්ගලයා මියගොස් ඇත. ප්‍රතිකාර සඳහා ඇතුලත් කල අනෙක් තිදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ පූනානි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ටිපර් රථය නොනවත්වා පලාගොස් ඇති අතර මියන්කුලම් ප්‍රදේශයේ ටිපර් රථ නැවතුම්පලක තාවතා සිටියදී ටිපර් රථය හා රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**